සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය ..................................   චිත්‍ර I   කාලය පැය තුනයි

| | | |
|---|---|---|
| උපදෙස් | - | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. |
| 1 කොටස | - | ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.<br>එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න. |
| 11 කොටස | - | අනු කොටස් තුනකින් සමන්විතය.<br>එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන, ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.<br>1 කොටස හා 11 කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න. |

## I කොටස

◆ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A, B, C, D, E යන ඡායාරූප ඇසුරින් තෝරන්න.**



A



B



C



D



E

01. A අක්ෂරයෙන් දැක්වෙන අනුරාධපුර යුගයට අයත් ඉසුරුමුණි පෙම් යුවල කැටයමේ කාන්තාවගේ හිසෙන් සංකේතවත් වන්නේ,
1. නිමලිත මුද්‍රාවයි.   2. නිහංචිත මුද්‍රාවයි.   3. ත්‍රිපතාක මුද්‍රාවයි.
4. ආවේත මුද්‍රාවයි.   5. මයුර මුද්‍රාවයි.   (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහන දැකගත හැකි වන්නේ,
1. අනුරපුර බිසෙන්මාලිගය ඉදිරිපිටදී ය.   2. මිහින්තලේ ඛණ්ඨක චෛත්‍ය පඩිපෙළ ඉදිරිපිටදීය.
3. පොලොන්නරු වටදාගෙයි ඉදිරිපිටදීය.   4. තිවංක පිළිමගෙයි ඉදිරිපිටදීය.
5. මැදිරිගිරිය වටදාගෙයි ඉදිරිපිටදීය.   (.......)

03. C අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
1. ව්‍යාඝ්‍රයින් සමග සටන් කරන මිනිසා   2. දෙවියා ශ්‍රාවකයන් සහ එළුවා
3. බැතිමතුන් හා දෙවියා   4. රයිනෝසිරස් ගවයින් හා දෙවියන්
5. යෝගාසන අං සහිත දෙවියා යන නමින් හඳුන්වයි.   (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන නාලාගිරි දමනය නම් කැටයම අයත් වන්නේ,
1. අමරාවතී කලා සම්ප්‍රදායටය.   2. භාරුත් කලා සම්ප්‍රදායටය.
3. එල්ලෝරා කලා සම්ප්‍රදායටය.   4. මතුරා කලා සම්ප්‍රදායටය.
5. ගන්ධාර කලා සම්ප්‍රදායටය.   (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙන ඉන්දියාවේ සාංචි කැටයම් නිර්මාණය කර ඇති බවට ඉතිහාසඥයින් හඳුන්වන්නේ,
1. අශෝක රජුගේ කාලයේදී ය. 2. සාතවාහනයන්ගේ කාලයේදී ය.
3. චන්ද්‍රගුප්ත මෞර්ය සමයේදී ය. 4. පල්ලවයින්ගේ සමයේදී ය.
5. කනිෂ්ක රජුගේ සමයේදී ය. (.......)

◆ **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

06. 'දෘශ්‍ය කලාව' යන්නෙහි මූලික වච්‍යාර්ථය වන්නේ,
1. චිත්‍ර කලාව යන්නයි. 2. චිත්‍රයක දැකීමේ කලාව යන්නයි.
3. වස්තූන්ගේ දෘශ්‍යරූපී බව යන්නයි. 4. දැකීම මුල් කරගත් කලාව යන්නයි.
5. ඇස සහ දැකීම මුල්කරගත් කලාව යන්නයි. (.......)

07. ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම,
1. බහුමාධ්‍ය කලාවක් ලෙස හඳුනාගත හැක. 2. අභිවාහස කලාවක් ලෙස හඳුනාගත හැක.
3. ග්‍රැෆික් කලාවක් ලෙස හඳුනාගත හැක. 4. සන්නිදර්ශන චිත්‍ර කලාවක් ලෙස හඳුනාගත හැක.
5. මුද්‍රණ කලාවක් ලෙස හඳුනාගත හැක. (.......)

08. විරෝධය, කෝපය, ප්‍රචණ්ඩත්වය ආදී ප්‍රකාශනයන් සහිත බොහෝ චිත්‍ර වල සුලභව දැකිය හැකි වර්ණයක් විය හැක්කේ,
1. නිල් වර්ණය 2. දම් වර්ණය 3. රතු වර්ණය 4. කොළ වර්ණය 5. කහ වර්ණය (.......)

09. 'වයනය' යන වචනය අර්ථ ගැන්වූ විට මින් වඩා නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. වස්තුවක මතුපිට ස්වභාවය යන්නයි. 2. වස්තුවක අභ්‍යන්තර ස්වභාවය යන්නයි.
3. වස්තුවක අවකාශමය ස්වභාවය යන්නයි. 4. වස්තුවක ගැඹුරු වූ ස්වභාවය යන්නයි.
5. වස්තුවක ගති ලක්ෂණ ස්වභාවය යන්නයි. (.......)

10. ප්‍රකෘති ලෝකයේ වස්තු මත ආලෝකය පතිත වීම තුළ වර්ණයන්ගේ ඇතිවන විපර්යාස අධ්‍යනය කිරීම.
1. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී සිතුවම් තුළ දැකිය හැක. 2. අධියථාර්ථවාදී සිතුවම් තුළ දැකිය හැක.
3. යථාර්ථවාදී සිතුවම් තුළ දැකිය හැක. 4. පශ්චාත් උපස්ථිතිවාදී සිතුවම් තුළ දැකිය හැක.
5. උපස්ථිතිවාදී සිතුවම් තුළ දැකිය හැක. (.......)

◆ **අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර 1 සිට 8 දක්වා නම් කර ඇති සත්ත්ව රූප ඇසුරු කරගෙන තෝරන්න.**



1 2 3 4 5 6 7 8

11. ඉන්දීය කලා නිර්මාණය අතර හඳුනාගත හැකි සත්ත්ව රූප මොනවාද?
1. 2,3 2. 2,4 3. 3,8 4. 3,4 5. 1,2 (.......)

12. විචාරකයින්ගේ මතයන් අනුව බෞද්ධ සංකල්ප සංකේතවත්මකව නිරූපනය වන සත්ත්ව රූප වන්නේ,
1. 4,1 2. 2,3 3. 3,1 4. 2,4 5. 3,4 (.......)

13. බෞද්ධ ජාතක කතා නිරූපණය හා සම්බන්ධ සත්ත්ව රූප මොනවාද?
1. 2,3 2. 4,5 3. 1,4 4. 6,7 5. 2,4 (.......)

14. මිසර ශිෂ්ටාචාරයෙන් හමුවන නිර්මාණ අතර ඇති සත්ත්ව රූප වන්නේ,
1. 5,6,7 2. 1,2,3 3. 4,5,6 4. 7,8,2 5. 2,3,4 (.......)

15. ග්‍රීක පුරාවෘත්තයක් හා බැඳුනු සත්ත්ව රූපය වන්නේ,
1. 1 2. 4 3. 6 4. 8 5. 3 (.......)

◆ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

16. පොළොන්නරු යුගයේ නිර්මාණය වූ පධිමඝර තුළ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයක් ලෙස
    1. පාදම කළු ගලින්, බිත්ති ගඩොල් හා පියස්ස දැවයෙන් ඉදිකිරීම දැක්විය හැක.
    2. භූමිය මත පිහිට වූ ගල් කණු මත දැවයෙක් ඉදිකිරීම් දැක්විය හැක.
    3. පාදමේ සිට පියස්ස දක්වා කළු ගලින් නිම කිරීම් දැක්විය හැක.
    4. පාදමේ සිට පියස්ස දක්වා ගඩොල් සහ හුණු බදාමයෙන් ඉදිකිරීම් දැක්විය හැකිය.
    5. ගල් කණු යොදා පියස්ස දැවයෙන් ඉදිකොට උළු සෙවිලි කිරීම දැක්විය හැකිය. (.......)

17. අශෝක ස්ථම්භ අතරින් සාරානාත් ස්ථම්භය,
    1. සිදුහත් උපත සිදු වූ ස්ථානය සිහිවීම පිණිස පිහිටුවා ඇත.
    2. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව සිදුකළ ස්ථානයේ පිහිටුවා ඇත.
    3. බුද්ධත්වයට පත්වීම සිහිවීම පිණිස එම ස්ථානයේ පිහිටුවා ඇත.
    4. බුද්ධ පරිනිර්වාණය සිදු වූ ස්ථානයේ පිහිටුවා ඇත.
    5. පළමුවැනි ධර්ම සංඝායනාව සිහිවීම පිණිස පිහිටුවා ඇත. (.......)

18. ග්‍රීක සම්භාව්‍ය යුගයෙන් පසු ඇතිවන හෙලනිස්ටික් යුගයේ ආරම්භය සඳහා බලපෑ සාධක ලෙස,
    1. සොක්‍රටීස්ගේ දර්ශනය හා ග්‍රීක පෞර රාජ්‍යයන්හි ආරම්භය දැක්විය හැකිය.
    2. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා යටතේ පෞර රාජ්‍යය එක්සත් වීම හා ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයින්ගේ අදහස් දැක්විය හැකිය.
    3. ප්ලේටෝගේ ජනරජ සංකල්පය මත ගොඩනැගෙන පිලිප් රජුගේ පාලනය.
    4. දෙවියන් කෙරෙහි විශ්වාසයන් බැහැරකොට තාර්කික බුද්ධියට මුල්තැන ලබාදීම දැක්විය හැකිය.
    5. ග්‍රීක ප්‍රදේශ රෝම පාලනයට නතුවීම දැක්විය හැක. (.......)

19. නුවර යුගයේ විහාරස්ථාන අතුරින් බුද්ධ චරිතය හා ජාතක කතා වස්තු නිරූපණය කිරීම අමතරව ශ්‍රී ලංකාවට වැදගත් ඓතිහාසික සිදුවීම් රාශියක් චිත්‍රයට නගා ඇත්තේ,
    1. මැදවල ටැම්පිට විහාරයේ ය. 2. කරගම්පිටිය සුබෝදාරාමයේ ය.
    3. දළදා මාළිගාවේ ය. 4. දෙගල් දොරව රජමහ විහාරයේ ය.
    5. දඹුල්ල රජමහා විහාරයේ ය. (.......)


20. ඉපැරණි බිතුසිතුවම් අතර මාර පරාජය හෝ බුද්ධත්වයට පත් වීම නිරූපිත අවස්ථාවන්හි බුද්ධ රූපය තුළ හඳුනාගත හැකි විශේෂිත මුද්‍රාව වනුයේ,
    1. අභය මුද්‍රාවයි. 2. ධම්මචක්‍ර මුද්‍රාවයි. 3. භූමි ස්පර්ශ මුද්‍රාවයි.
    4. වරද මුද්‍රාවයි. 5. විතර්ක මුද්‍රාවයි. (.......)

◆ **අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ප්‍රශ්න වලට ඉදිරියේ ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. මෙම නිර්මාණයේ දෙකෙලවර ඇති ගල් කණු මත නිරූපිත සත්ත්ව රූප තුළින්,
    1. චතුරාර්ය සත්‍ය නිරූපණය වේ.
    2. සතර බිය නිරූපණය වේ.
    3. සරත දිශාව නිරූපණය වේ.
    4. බුදු සිරිතේ අවස්ථා හතරක් නිරූපණය වේ.
    5. සතර පෙර නිමිති නිරූපණය වේ. (.......)



22. මෙහි දැක්වෙන මිසර දේවස්ථානය,
    1. දේවස්ථාන කිහිපයකින් සමන්විත වේ.
    2. පාෂාණ මාධ්‍යයෙන් ඉදිකළ දේවස්ථානයකි.
    3. හෝරස් දෙවියන් වෙනුවෙන් ඉදිවූ දෙවස්ථානයකි.
    4. පර්වත කැනීමේ සම්ප්‍රදාය අනු නිම වූ දේවස්ථානයකි.
    5. තිබ්ස්හි හඳුනාගත හැකි දේවස්ථානයකි. (.......)



23. පෙළොන්නරුවේ ඇති අංක 01 ශිව දේවාලය වන මෙහි,



1. පාණ්ඩ ගෘහ නිර්මාණ ශිල්පය අනුව නිර්මාණය වී ඇත.
2. වානවන් දේවි මා ඊශ්වරම් නමින් හඳුන්වයි.
3. පියස්ස තෙක් පාෂාණ මාධ්‍ය භාවිතයෙන් ඉදිකොට ඇත.
4. දකුණු ඉන්දීය විජය නගර් නම් සම්ප්‍රදාය අනුව ඉදිකොට ඇත.
5. දකුණු ඉන්දීය පල්ලව ගෘහ නිර්මාණ ලක්ෂණ හඳුනා ගත හැකය. (.......)

24. බෞද්ධ කලාවේ මූලාරම්භය පිළිබඳ සාධක ලෙස දැක්විය හැකි සාංචි ස්තූපය,



1. බුද්ධ කාලයට අයත් වේ.
2. ශුංග යුගයේ ඉදිවී ඇත.
3. පල්ලව නිර්මාණයකි.
4. කුෂාණයින් විසින් නිර්මාණය කොට ඇත.
5. මෞර්ය යුගයට අයත් වේ. (.......)

25. ලාංකික බෞද්ධ ගෘහ නිර්මාණ අංගයක් වන පධානඝර තුළ හමුවන කැටයම්,



1. ඉතා සීමාකාරී ලෙස අවස්ථානෝචිතව භාවිතා කොට ඇත.
2. බෞද්ධ කැටයම් කලාවේ මහිමය විදහා දක්වයි.
3. කැටයම්කරුවන්ගේ නිර්මාණශීලිත්වය ප්‍රකට කරයි.
4. බෞද්ධ සංකල්ප අර්ථාන්විතව නිරූපණය කරයි.
5. සියුම් මටසිලිටු නිමාවෙන් යුක්තය. (.......)

◆ **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F, G, H, I, J යන චිත්‍ර ඇසුරෙන් තෝරන්න.**



F G H I J

26. F අක්ෂරයෙන් දැක්වෙන මහ ඉලුප් පල්ලම ප්‍රතිමාවෙන් ඉන්දීය අමරාවතී සම්ප්‍රදායේ ලක්ෂණ ප්‍රකට වන බවට විචාරකයින් අදහස් දක්වන්නේ,
1. හිටි ඉරියව්ව ඒකාංශ කළ චීවරය පහළින් සංඝාටිය දක්වා ඇති අයුරිනි.
2. පිහිටි ගලේ ස්වභාවය භාවිතයට ගෙන ඇති නිසාය.
3. සරල චාම් නිමාවෙන් යුක්ත වන නිසාය.
4. ග්‍රීක ස්වාභාවික ලක්ෂණ සහිත වන නිසාය.
5. බාහිර ස්වරූපයට වඩා අභ්‍යන්තරික ගුණයන් නිරූපණය වන නිසාය. (.......)

27. හින්දු ආගමික නිර්මාණයක් වන නටරාජා ප්‍රතිමාවෙහි,
1. හින්දු ආගම හා බැඳුනු නර්තන කලාවේ විසිතුරු බව නිරූපණය වේ.
2. නර්තනය හා විනාශකාරී බව සංකේතීයව නිරූපණය කරයි.
3. ශිව දෙවියන් සතු උත්තරීතර භක්තිය සංකේතීයව නිරූපණය කරයි.
4. ශිව දෙවියන්ගේ පංච විධි ක්‍රියා හා බැඳුණු බල පරාක්‍රමය සංකේතීයව නිරූපණය කරයි.
5. නර්තනය ආගමික ක්‍රියාවලියක් ලෙස දක්වයි. (.......)

28. උපස්ථිතිවාදීන් අතුරින් මූර්තිකරණයේ නියැලුණු ශිල්පියෙකු විසින් නිර්මාණය කරන ලද බැලේ නර්තනය හා බැඳුණු ප්‍රකාශනය H අකුරෙන් දැක්වේ. එම ශිල්පියා,

| | | |
|---|---|---|
| 1. ක්ලෝඩ් මොනේ | 2. එඩ්ගා ඩෙගා | 3. පියරේ ඔගුස්ට් රෙනෝර් |
| 4. කැමිලි පිසාරෝ | 5. එඩුවාඩ් මනේ | (.......) |

29. I අක්ෂරයෙන් දැක්වෙන කවන්ද ප්‍රතිමාවේ සඳහන් වන ආකාරයට එම ප්‍රතිමාව,
1. සමුද්‍ර ගුප්ත රජුගේ ය. 2. අශෝක රජුගේ ය. 3. කනිෂ්ක රජුගේ ය.
4. නරසිංහ වර්මන් රජුගේ ය. 5. චන්ද්‍ර ගුප්ත මෞර්ය රජුගේ ය. (.......)

30. J අක්ෂරයෙන් දැක්වෙන ග්‍රීක හෙලනිස්ටික් යුගයට අයත් ජයග්‍රහණයේ දෙවඟන නිරූපිත ප්‍රතිමාව කෙරෙන් හඳුනාගත හැකි එම යුගයට අයත් පොදු ලක්ෂණය වන්නේ,
1. වේගය හා චලනය දැක්වීමයි. 2. කාන්තා සෞන්දර්ය නිරූපණයයි.
3. ශෝකය වේදනාව ආදී ගුණ නිරූපණයයි. 4. ශරීරයේ කාය ව්‍යවච්ඡේද ලක්ෂණ දැක්වීමයි.
5. ග්‍රීක දේව සංකල්ප නිරූපණයයි. (.......)

◆ **අංක 31 සිට 35 දක්වා අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර K,L,M,N,O යන අක්ෂර වලින් දක්වා ඇති රූප සටහන් ඇසුරින් තෝරන්න.**


K

L

M

N

O

31. K අක්ෂරයෙන් දැක්වෙන ජේ.ඩී.ඒ. පෙරේරාගේ සිතුවම තුළින්,
1. නර්තනයේ යෙදෙන කාන්තාවකගේ විචිත්‍රවත් බව නිරූපණය කරයි.
2. ශාස්ත්‍රාලීය මූලධර්ම අකුරටම අනුගමනය කරයි.
3. ශාත්‍රාලීය මූලයන් මත පිහිටා දෘශ්‍ය කලාවේ ප්‍රකාශනාත්මක පැතිකඩ ගවේෂණය කරයි.
4. ශාත්‍රාලීය මූලයන්ට එරෙහිව ගමන් කරයි.
5. නර්තනයේ විචිත්‍රත්වයට වඩා නර්තනයේ අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනය නිරූපණය කරයි. (.......)

32. L අක්ෂරයෙන් නිරූපිත සෝලියස් මෙන්ඩිස්ගේ මෙම සිතුවම් ශෛලිය සඳහා ඍජු බලපෑමක් ඇති **නොකළ** සිතුවම් ලෙස,
1. භාග් ගුහා චිත්‍ර දැක්විය හැකිය. 2. අජන්තා ගුහා සිතුවම් දැක්විය හැකිය.
3. තිවංක පිළිමගේ සිතුවම් දැක්විය හැකිය. 4. තන්තිරිමලේ ගුහා සිතුවම් දැක්විය හැකිය.
5. එල්ලෝරා කැටයම් දැක්විය හැකිය. (.......)

33 M අක්ෂරයෙන් නිරූපිත රවි වර්මාගේ සිතුවම්කරණයේ සාමාජීය භාවිතය හා ශෛලියට සමාන ලක්ෂණ ශ්‍රී ලංකාව තුළ හඳුනා ගත හැක්කේ,
1. සෝලියස් මෙන්ඩිස් තුළින් ය. 2. ජේ.ඩී.ඒ. පෙරේරා තුළින් ය.
3. එම්. සාර්ලිස් තුළින් ය. 4. එල්.ටී. මන්ජු ශ්‍රී තුළින් ය.
5. රිචඩ් හෙන්රිකස් තුළින් ය. (.......)

34. N අක්ෂරයෙන් නිරූපිත සිතුවම නිර්මාණය කළ පෝල් සෙසාන්
1. රේඛාව සඳහා මූලිකත්වය ලබා දී ඇත.
2. සිතුවම් ආකෘතිය හා සංවිධානය පිළිබඳ මූලිකත්වය දී ඇත.
3. ශාස්ත්‍රාලීය මූලධර්ම බැහැර කොට ඇත.
4. වර්ණයේ ක්‍රියාකාරීත්වය දක්වා ඇත.
5. වියුක්ත හැඩතල භාවිතා කොට ඇත. (.......)

35. O අක්ෂරයෙන් දැක්වෙන රොවුන් පල්ලිය නැමති සිතුවම් ඇඳි ශිල්පියා එම වස්තු විෂය නැවත නැවත චිත්‍රයට නගනු ලබන්නේ,
1. වස්තු විෂය හා ශිල්පියා සතු ආත්මීය බැඳීම නිසාය.
2. ගැනුම්කරුවන්ගේ ඉල්ලුම ඉහළ මට්ටමක පැවති නිසාය.
3. ඔහුට ඇඳීමට වෙනත් වස්තු විෂයයක් අවශ්‍යය නොවූ නිසාය.
4. වරින් වර වෙනස්වන ආලෝකය අනුව වර්ණයේ ක්‍රියාකාරීත්වය ග්‍රහණය කර ගැනීම සඳහා ය.
5. නිර්මාණකරණය සඳහා පාදක කොට ගන්නා වස්තු විෂයේ ප්‍රබලත්වය ප්‍රකාශ කිරීම සඳහා ය. (.......)

◆ **අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.**



36. මෙම ප්‍රතිමාව,
1. පද්මපාණී බෝසත් රුව ලෙස හඳුන්වයි.
2. අවලෝකිතේෂ්වර බෝසත් රුව ලෙස හඳුන්වයි.
3. අර්ධනාරී නටේෂ්වර ප්‍රතිමාව ලෙස හඳුන්වයි.
4. ශිව දෙවියන්ගේ එක් ස්වරූපයක් ලෙස හඳුන්වයි.
5. නාථ දෙවියන්ගේ ප්‍රතිමාවක් ලෙස හඳුන්වයි. (.......)

37. මෙම ප්‍රතිමාව අයත් වන්නේ,
1. අනුරාධපුර යුගයේ මුල් කාලයට ය.
2. අනුරාධපුර යුගයේ අවසාන කාලයට ය.
3. පොළොන්නරු යුගයේ මුල් කාලයට ය.
4. පොළොන්නරු යුගයේ අවසාන කාලයට ය.
5. මහනුවර යුගයේ මුල්කාලට ය. (.......)

38. මෙම ප්‍රතිමාවේ ශිල්ප ක්‍රමය වශයෙන් ගත්කළ,
1. ලෝකඩ මාධ්‍යයෙන් ඝන වාත්තු ක්‍රමයට සකසන ලද්දකි.
2. ලෝකඩ මාධ්‍යයෙන් කුහර වාත්තු ක්‍රමයට සකසන ලද්දකි.
3. ලෝකඩ මාධ්‍යයෙන් පස්වාත්තු ක්‍රමයට සකසන ලද්දකි.
4. බදාම මාධ්‍යයෙන් ඇඹීමේ ශිල්පක්‍රමයට සකසන ලද්දකි.
5. රනින් වාත්තු කිරීමේ ශිල්පක්‍රමයට සකසන ලද්දකි. (.......)

39. මෙම ප්‍රතිමාවේ දක්නට ලැබෙන්නේ,
1. මහාරාජ ලීලාසන ක්‍රමයයි.
2. ලලිතාසන ක්‍රමයයි.
3. සමභංග ඉරියව් ක්‍රමයයි.
4. මහාරාජ ලාලිතාසන ක්‍රමයයි.
5. භද්‍රාසන ක්‍රමයයි. (.......)

40. මෙම ප්‍රතිමාවේ දකුණු හස්තයෙන්
1. කටක හස්ත මුද්‍රාව දැක්වේ.
2. අංජලී හස්ත මුද්‍රාව දැක්වේ.
3. ලෝල හස්ත මුද්‍රාව දැක්වේ.
4. අභය මුද්‍රාව දැක්වේ.
5. විතර්ක මුද්‍රාව දැක්වේ. (.......)

# 12 ශ්‍රේණිය - චිත්‍ර I

## II කොටස

- මෙය අනු කොටස් තුනකින් සමන්විතය.
- එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

## 'අ' කොටස

## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

### ශ්‍රී ලංකාව

01. පොළොන්නරු ශිව දේවාල දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ලක්‍ෂණ අනුව ඉදිකර ඇත. කැපූ කළු ගලින් ගෙඩිගේ සම්ප්‍රදායට අනුව නිමකර ඇති මෙම ගොඩනැගිලි වලින් සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබිඹු කරයි.
   - i. ශිව දේවාල වල සුවිශේෂී වාස්තු විද්‍යා ලක්‍ෂණ දෙකක් නම් කරන්න. (ල. 04)
   - ii. පොළොන්නරුවේ අංක I ශිව දේවාලයේ ගෘහ නිර්මාණ ලක්‍ෂණ පිළිබඳ පැහැදිලි කරන්න. (ල.06)
   - iii. පොළොන්නරුවේ ශිව දේවාල දෙක හා අනෙකුත් ගොඩනැගිලි පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න. (ල. 10)

02. සීගිරිය, හිඳගල, ගොනාගොල්ල, මහියංගන සෑයේ ධාතු ගර්භය යන ස්ථානයන්හී දී අනුරාධපුර යුගයට අයත් සිතුවම් දක්නට ඇත. ඒ අතරින් සීගිරි සිතුවම් චිත්‍රණයකර ඇත්තේ පෙරදිග සම්භාව්‍ය කලා සම්ප්‍රදායේ රීති අනුවය. ඉන්දියාවේ අජන්තා හා භාග්‍යන ස්ථාන වලද මෙම සිතුවම් වලට සමාන සිතුවම් පවතින බව ප්‍රකටය.
   - i. සීගිරි සිතුවම් පිළිබඳ විවිධ මතවාද ඇතිබව පොත පතෙහි සඳහන් ය. ඉන් මතවාද දෙකක් සඳහන් කරන්න. (ල.04)
   - ii. සීගිරි සිතුවම් වලට මූලිකවම වස්තු විෂය වී ඇත්තේ කාන්තා උඩුකය රූපය වේ. බෙහෙවින් ලාලිත්‍යමය ස්වරූපයකින් යුක්ත මෙම කාන්තා රූප වල කලාත්මක ලක්‍ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 06)
   - iii. අනුරාධපුර, යුගයට අයත් සිතුවම් අතර හමුවන හිඳගල, ගොනාගොල්ල හා මහිගංගනය ධාතු ගර්භයේ සිතුවම් වල විශේෂතා, සීගිරි චිත්‍රවල සුවිශේෂතා, සමඟ සසඳමින් විග්‍රහ කරන්න. (ල. 10)

## 'ආ' කොටස

## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

### ඉන්දියාව

03. ඉන්දියාවේ යමුනා ගඟබඩ මථුරා නගරය කේන්ද්‍ර කොටගෙන ක්‍රි.ව. පළමුවන සියවසේ දී පමණ මථුරා කලා සම්ප්‍රදාය බිහි වී ඇත. මථුරා කලාව උසස් ම තත්වයට පත්වී ඇත්තේ ගුප්ත යුගයේ දී ය.
   - i. දේශීය ලක්‍ෂණ සහිත නිර්මාණ මථුරා කලා ශිල්පීන් විසින් බිහිකර ඇති අතර බුදු පිළිම නිර්මාණයේදී අධ්‍යාත්මික ගුණාංග ප්‍රකට කිරීම පිළිබඳ සැලකිලිමත්ව ඇත. මථුරා බුදු පිළිම වල කලා ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 04)
   - ii. මථුරාහි කත්‍රා බුද්ධ ප්‍රතිමාව නිර්මාණයේදී දැකිය හැකි සුවිශේෂී කළා ලක්‍ෂණ පිළිබඳ කරුණු කෙටියෙන් සඳහන් කරන්න. (ල. 06)
   - iii. මථුරාහි ජමල්පූර් හිටි පිළිමය හා ගුප්ත සම්ප්‍රදායේ සාරානාත් බුදු පිළිමයේ භාව ප්‍රකාශනය හා කලාත්මක අගය විමසන්න. (ල.10)

04. ඉන්දියාවේ මහාරාෂ්ඨ ප්‍රාන්තයේ අජන්තා ග්‍රාමය ආශ්‍රිතව වඝෝරා නදියට මුහුණලා ඇති අඩි 300 ක් පමන උස ගල් පර්වතයක අජන්තා ගුහා නිර්මාණය කර ඇත. ක්‍රි.පූ. 01 වන සියවසේ සිට ක්‍රි.ව.08 වන සියවස දක්වා වරින් වර අජන්තා චිත්‍ර නිර්මාණය කර ඇති බව කියැවේ.

i. අජන්තා චිත්‍රවලට තේමා වී ඇති බෞද්ධාගමික සිද්ධි දෙකක් නම් කරන්න. (ල.04)

ii. අජන්තා චිත්‍ර වල ශිල්පක්‍රමය හා වර්ණ භාවිතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)

iii. අජන්තා චිත්‍රවල විශේෂතා දක්වමින් සංරචනය හා භාව ප්‍රකාශනය පිළිබඳ ඇගයීමක් කරන්න. (ල.10)

## 'ඉ' කොටස

## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

### යුරෝපය

05. නයිල් ගංගාධාරය පදනම් කරගෙන ඇති වූ මිසර ශිෂ්ටාචාරය පැරණි මෙන්ම දීර්ඝතම ශිෂ්ඨාචාරයයි. චිත්‍ර, මූර්ති, කැටයම්, හා පිරමීඩ ආදී කලා නිර්මාණ සඳහා සුවිශේෂ දක්‍ෂකමක් දැක් වූ ඊජිප්තියානු කලා නිර්මාණ කලාත්මක බවින් අනූනය.

i. ඊජිප්තියානු මූර්ති සඳහා වස්තු විෂය වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ල.04)

ii. 'මෙන්කුරේ රජු හා ඔහුගේ බිරිය' යනු සිටගත් ඉරියව්වෙන් යුතු ඊජිප්තියානු යුගල මූර්තියකි. මෙම මූර්තිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.06)

iii. මිසර ස්ක්‍රයිබ් ප්‍රතිමාව සහ නෙපර්ටිටි උඩුකය මූර්තිය යන මූර්ති දෙකෙහි ඇති ස්වභාවිකවාදී ලක්‍ෂණ හා යථාර්ථවාදී ලක්‍ෂණ පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න. (ල.10)

06. උපස්ථිතිවාදය යනු 19 වන සියවසේ දී පැරීසිය මුල්කරගත් නිදහස් කලාකරුවන් පිරිසකගේ අත්හදා බැලීම් ඔස්සේ දියුණු වූ කලා ව්‍යාපාරයකි.

i. මෙම කලා ව්‍යාපාරයේ විශේෂ ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න. (ල.04)

ii. ක්ලෝඩ් මොනේ යනු උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ පුරෝගාමී චිත්‍ර ශිල්පියෙකි. ඔහුගේ හිරු උදාව උපස්ථිතියක් සිතුවම පිළිබඳ ඇගයීමක් කරන්න. (ල.06)

iii. උපස්ථිතිවාදී කලාකරුවන් අතර එඩ්ගා ඩෙගා ශිල්පියාගේ ඔබ හඳුනාගත් විශේෂතා ඔහුගේ නිර්මාණ ඇසුරින් විමසන්න. (ල.10)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 | S | II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ..................................

චිත්‍ර II

කාලය පැය තුනයි

<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.

## <u>ස්වභාවිකත්ව අධ්‍යනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය</u>

- කඩදාසි තලය අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
- ද්‍රව්‍යවල හා පැලැටියේ අතු රිකිල්ලේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස්මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක රීති පිළිබඳව සැළකිලිමත් වන්න.
- ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැළකිල්ලට ගෙන වර්ණ කරන්න.
- වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිතා කරන්න.
- ද්‍රව්‍ය සමූහයට ගැලපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කර ගැනීමට පිළිවන
- දිය සායම්, පෝස්ටර්, සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිතා කළ හැකිය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

51 | S | III

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය ..................................

චිත්‍ර III

කාලය පැය තුනයි

උපදෙස් :-

- උත්තර පත්‍රයේ පිටුපස ඔබගේ විභාග අංකය සහ ප්‍රශ්න අංකය පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ'කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණ චිත්‍රයක් අඳින්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. අවුරුදු උළෙලේ කනාමුට්ටි බිඳීමේ තරඟයේ උද්වේගකර අවස්ථාවක්
2. වළං තැනීමේ කර්මාන්තයේ නිරත ගැමි පිරිසක් හෝ බඩ ඉරිඟු වගාවක වගා කටයුතු වල යෙදී සිටින ගොවි ගෙවිලියෝ
3. ආරණ්‍යයක බෝධිපූජා පින්කමක යෙදී සිටින බැතිමතුන්
   හෝ
   කලබකාරී දුම්රිය නැවතුම්පලක ඔබ මොබ යන පිරිස අතරේ වෙළදාමේ යෙදී සිටින වෙළඳුන්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

4. විදේශීය වෙළඳපලට හඳුන්වාදීම සඳහා යෝග්‍ය වන සේ කුළුබඩු වර්ග කීපයක් ඇසිරිය හැකි රැගෙනයාමට පහසු බැඳුනක් පියන හා හැඩලය සහිතව නිර්මාණය කරන්න.
5. ආලින්දයක් සැරසීම සඳහා සමචතුරස්‍රාකාර හැඩයෙන් යුතු අඩි 10 x 10 ප්‍රමාණයේ බුමුතුරුණකට සුදුසු සැරසිල්ලක් සාම්ප්‍රදායික ඒකක හෝ නිර්මාණාත්මක හැඩතල ඇසුරින් නිර්මාණය කරන්න. රතු පැහැයේ ප්‍රභේද යොදන්න.
6. සත්ත්ව රූප ඇසුරින් බතික් ක්‍රමයට නිම කිරීම සඳහා සුදුසු කාන්තා හෝ පිරිමි ඇඳුමක වාටි සැරසිල්ලක් නිර්මාණය කරන්න.
   නැතහොත්
   දේශීය ක්‍රමයේ පිසූ ආහාර අළෙවි කරන බොජුන් හලක් ඉදිරිපස අලංකාරයට තැබීම සඳහා සුදුසු එහි අර්ථය ද පැහැදිලි වන සේ වූ විශාල ප්‍රමාණයේ බඳුනක් නිර්මාණය කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

7. නව වසර උදෙසා ඔබේ පාසලේ පවත්වනු ලබන 'සූර්ය මංගල්‍ය' පිළිබඳව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක පෝස්ටරයක් නිර්මාණය කරන්න.
8. අලුතින් වෙළඳපලට හඳුන්වාදීමට නියමිත ශාකසාර ඇසුරින් නිපදවන ලද තරුණියන්ගේ රුව වඩන ආලේපනයක් සඳහා සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න. සුදුසු නාමයක් ද යොදන්න.
9. 'බොදු වෙසක් උත්සවයේ අරුත' යන මැයෙන් පුවත්පතක පල කෙරෙන විශේෂාංග ලිපියක් සඳහා වර්ණ සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
   නැතහොත්
   'මාර්ග ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමු' යන තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

## තෙවන වාර පරීක්ෂණය 2018 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන

## மூன்றாம் தவணைப் பரீட்சை – 2018 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்


## 12 ශ්‍රේණිය – தரம் 12

**ශාලාධිපතිට උපදෙස්**

**අවශ්‍ය ද්‍රව්‍ය :-** අරලිය මල් සහිත අත්තක්
කුඩා මැටි කලයක්
ඇපල් ගෙඩියක්
පීරිසියක්
අඩක් කහ පැහැති ජලයෙන් පුරවන ලද වීදුරුවක්
බීම බටයක්
හතරැස් බිස්කට් පෙට්ටියක් (සුදු කඩදාසියෙන් ආවරණය කර) වර්ණවත් රෙදි කැබැල්ලක්
ද්‍රව්‍ය තැබීමට ආධාරකයක් (ඩ්‍රෝවින් බෝඩ්)

**மேற்பார்வையாளருக்குரியது.**

**தேவைப்படுபவை :** அரலிய பூவுடன் கொப்பு
சிறிய குடம்
அப்பிள் காய் ஒன்று
பீரிஸ் ஒன்று
மஞ்சள் நிற நீர் உள்ள கண்ணாடி குவளையொன்று
ஸ்ரோ பட்ட
சதுர பிஸ்கட் பெட்டி (வெள்ளை கடதாசியில் சுற்றி)
துணித் துண்டு
பொருட்களை ஒழுங்கு படுத்தி வைக்கும் பலகை



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය - 2018 - 12 ශ්‍රේණිය
## චිත්‍ර කලාව I - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 4 | 21. | 3 | 31. | 5 |
| 2. | 3 | 12. | 2 | 22. | 4 | 32. | 4 |
| 3. | 5 | 13. | 3 | 23. | 1 | 33. | 3 |
| 4. | 1 | 14. | 1 | 24. | 5 | 34. | 2 |
| 5. | 2 | 15. | 4 | 25. | 1 | 35. | 4 |
| 6. | 5 | 16. | 4 | 26. | 1 | 36. | 2 |
| 7. | 3 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 8. | 3 | 18. | 2 | 28. | 2 | 38. | 1 |
| 9. | 1 | 19. | 5 | 29. | 3 | 39. | 4 |
| 10. | 5 | 20. | 3 | 30. | 1 | 40. | 1 |

**චිත්‍ර කලාව I පත්‍රය**
**I කොටස 1 x 40 = 40**
**II කොටස 60 = <u>60</u>**
**100**

**I පත්‍රය සඳහා** = ලකුණු 100 **II පත්‍රය** = ලකුණු 100 **III පත්‍රය** = ලකුණු 100 = 300/3

## II කොටස

01. (i) පැන්නුම් කුළුණු, විමාන

(ii) * පාණ්ඩ්‍ය ගෘහනිර්මාණ ශිල්පයට අනුව ඉදිකර ඇත.* කැපූ කළුගල් කුට්ටි සම්බන්ධකර නිර්මාණය කර තිබේ.
* මණ්ඩපය, අන්තරාලය, ගර්භගෘහය යන අංග වලින් සමන්විතය.
* පියස්ස මත ගඩොලින් නිමකළ ශිඛරය විනාශ වී තිබේ.
* හතරැස් ගර්භගෘහය මැද ශිව ලිංගය තැන්පත් කර ඇත.

(iii) * දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය හා චෝල ගෘහ නිර්මාණ ශෛලීය ලක්ෂණ අනුව අංක 01 සහ 02 ශිව දේවාල ගොඩනගා ඇත.
* දේවාල දෙකම කැපූ කලු ගලින් නිමවා ඇත.
* පොළොන්නරු යුගයේ විහාරවලද චෝල, පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ වල ලක්ෂණ දැකිය හැකි බව.
* පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල රජු දවස කළ ගෙඩිගෙ හි පිළිස්සූ ගඩොලින් කර ඇති බව.
* රාජ වේශී භුජංග මණ්ඩපය ශිව දේවාල වලට වඩා විසිතුරු මල් ලියකම් වලින් යුක්ත බව.
* ශිව දේවාල හැර අනෙක් ගොඩනැගිලි ආයත චතුරශ්‍රාකාර බව.
* ගොඩනැගිලිවල බිත්ති අඟල් 30, 40, 50 ආදී ලෙස ඝනව බැඳ ඇති බව.
* බිත්ති වල විමානාක්ෂර කොටස් පන්නා ඇති බව.
* සියළු ගොඩනැගිලිවල අර්ධ කවාකාර ශිකර තිබූ බව.
* හින්දු ගෘහනිර්මාණ ශිල්පයේ සියලු ලක්ෂණ සහිතව ථූපාරාම ගොඩනැගිල්ල තනා ඇති බව.

02. (i) * විජ්ජුලතා හා මේඝලතා * කාශ්‍යප රජුගේ අන්තඃපුර ස්ත්‍රීන් බව.
* සීගිරි රාජධානියේ කුමාරිකාවන් හා සේවිකාවන් බව

(ii) * සාමාන්‍ය භූමි මට්ටමින් අඩි 600 ක් පමණ උසට විහිදුන පර්වතයේ බටහිර පැත්තේ පිහිටි විශාල කුහරයක සීගිරි බිතු සිතුවම් ඇඳ ඇත.
* රළු පර්වත බිත්තියෙහි අතුරන ලද ඝන බදාමය මත වර්ණ චිත්‍ර 22 කි.
* මෙම රූප වලින් දැක්වෙන්නේ කාන්තා රූප ගණනාවකි.
* ශරීරයේ ඉනෙන් උඩ කොටස පමණක් දක්වා ඇත.
* වලාකුළුවලින් වැසී තිබෙන ආකාරය දක්වා තිබේ.
* තනි රූප වශයෙන්ද යුගල රූප වශයෙන් ද ඇඳ ඇත.
* මානව රුවක සාමාන්‍ය ජීව ප්‍රමාණයට ඇඳ ඇත.
* රේඛාවේ ඇති ප්‍රාණවත් බව හා ස්ථිරතාවය නිසා රේඛා රිද්මය පිළිබඳ දැනුම පැහැදිළි වේ.
* නිදහස් රේඛා හා සරල තෙලිතුඩු පෑන්වල දක්වා ඇති බව පෙනේ.
* රූප ලකුණු කරගත් වර්ණයට වඩා වෙනස් අයුරකින් ස්ථිර රේඛා ඇඳ ඇත.
* කාන්තා රූපවල ඉරියව් හා මුහුණු වලින් ඔවුන්ගේ අධ්‍යාත්මික හැඟීම් ද ප්‍රකාශ කර ඇත.
* වර්ණ කිරීම සඳහා රත්දුඹුරු කහ, කොළ, නිල් වර්ණ යොදාගෙන තිබේ.
* කාන්තා රූප වල උඩුකය දුහුල් වස්ත්‍රයකින්ද යටිකය කෙටි කබායකින්ද ආවරණය කර ඇත.

* හිස් පළඳනා මල් වලින් වර්ණවත් කර තිබේ.   * විවිධ ස්වර්ණාභරණ පැළඳ සිටින බව.
* ඕලු, නෙළුම්, මානෙල් මල්, අතින්ගෙන සිටින විලාසයද, එක් අතකින් මලක්ගෙන අනෙක් අතින් පෙති දිගහරින විලාසයද පෙන්වා තිබේ.
* ප්‍රාණ පූර්ණ රේඛාව, ත්‍රිමාණ ලක්ෂන, සෞම්‍ය වර්ණ මාලාව ආදී අංගවලින් යුක්ත වන බව.

(iii) * ක්‍රි.ව. 6-7 සියවස් වලට අයත් යැයි සැලකෙන හිඳගල චිත්‍ර වල බුදු රුවක් චිත්‍රයට නගා ඇති පැරණිම ශ්‍රී ලාංකීය චිත්‍ර වේ.
* දැනට මෙහි ඇත්තේ විශාල සංරචනයකින් ශේෂ වූ කොටසකි.
* මෙහි බුද්ධ රූප දෙකක් ඉතිරිව ඇත.
* බුදු රුව අනෙකුත් රූප වලට වඩා විශාලව දක්වා ඇත. එම නිසා සුවිශේෂ ප්‍රමුඛතාවයක් ලැබී ඇත.
* සීගිරි චිත්‍ර සම්ප්‍රදායෙන් තරමක් වෙනස් ලක්‍ෂණ පෙන්වා ඇත.
* සීගිරි චිත්‍ර වල මෙන් රේඛාවට ප්‍රමුඛත්වය දී නැත.
* වර්ණ වලින් ත්‍රිමාණ බව ගොඩනගා ඇත.
* නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ගොනාගොල්ල පිහිටා ඇත.
* හිඳගල සිතුවම් මෙන්ම විශාල සංරචනයකින් කොටසක් ශේෂව ඇත.
* ක්‍රි.ව. 5-7 සියවල් වලට අයත්ය.
* ස්ත්‍රී පුරුෂ රූප දෙකෙකි. පුරුෂ රූපය විශාලව දක්වා ඇත.
* සීගිරි චිත්‍රවල මෙන් සෞම්‍ය වර්ණ මාලාවක් භාවිතා කර නැති අතර, කහ, රතු. තැඹිලි කළු ආදී උණුසුම් වර්ණ මාලාවක් යොදා ඇත.
* මහියංගන ධාතු ගර්භයේ අභ්‍යන්තරයෙහි ඇඳ ඇති සිතුවම් ක්‍රි.ව. 9-11 සියවස් වලට අයත් යැයි අනුමාන කෙරේ.* සම්පූර්ණ සිතුවම අද දක්නට නැත.* විශාල සංරචනයකින් ශේෂ වූ කොටස් සංරක්ෂණය කර ඇත.
* බුද්ධත්වය නිරූපණය වෙතැයි සැලකේ.
* මඳ සිනා සහිත බුදු රුව පිටුපසින් අලංකාර ආසනය කවාකාර රැස් වළල්ල යෙදීම වැදගත් ලක්‍ෂණයෝ වෙති.  * මල් වට්ටියක් අතින් ගත් විෂ්ණු දෙවියන් සිතුවටම නගා ඇත.
* සීගිරි රූපවල මෙන් රේඛා කරණය ප්‍රබල වේ.  * වර්ණ මාලාව ගොනාගොල්ල සිතුවම්හි මෙනි.
* වස්තු විෂය අතින්ද මේ සියලු තැන්හි සිතුවම් සීගිරියට වඩා වෙනස් වේ.

## ඉන්දියානු කලා ඉතිහාසය

03. (i) * චාම් බව හා ජීවමාන බව, අඩවන් නෙත්, ලඹ සවන් හා ඌර්ණ රෝම ධාතුව, පිරිපුන් මට සිලිටු අඟ පසඟ.

(ii) * සිංහ රූ තුනක් සහිත ආසනයක් මත වැඩ හිඳින පිළිමයකි.
* පද්මාසන ක්‍රමයට දෙපා තබාගෙන ඇත.        * දකුණත අභය මුද්‍රාව සහිතය.
* මෙම පිළිමයේ මුහුණින් පෙන්වන කරුණාබර බව මථුරා පිළිමවල දක්නට ඇති හැඟීම් ප්‍රකාශනයේ දක්‍ෂතාව පැහැදිලි කරයි.* කත්‍රා නම් ස්ථානයෙන් හමුවූ නිසා මේ නම භාවිතා කර ඇත.

(iii) *මථුරාහි ජමල්පූර් හිටි පිළිමයත් සාරානාත් බුදු පිළිමයත් ගුප්ත කලා සම්ප්‍රදායට නිමවා ඇත.
* ජමල්පූර් මථුරා හිටි පිළිමයේ ඉතා සුන්දර කඩවසම් දේහ ලක්ෂණ ප්‍රකට වන සේ නෙළා ඇත. සාරානාත් පිළිමය සිවුර තුලින් ශරීර හැඩය මනාව මතුවන සේද මාංශ පේශී ඉද්මතු නොවන සේද කඩවසම්ව නෙලා ඇත.
* පිළිම දෙකෙහිම දෙවුර වැසෙන සේ සිවුර රැළි සහිතය.
* අඩවන් නෙත්, මද සිනාව, ලඹ සවන්, උෂ්ණීෂය සහිත කුණ්ඩලාංකාර හිසකේ ආදිය ක්‍රමවත්ව කලාත්මකව ජමල්පූර් පිළිමයේ නෙලා ඇති අතර, සාරානාත් පිළිමයේ චාපාකාර දෙනෙත්, දේදුණු ඇහිබැම, අඹ පල වලින් පිරිපුන් දෙතොල්, ලඹ සවන්, අණ්ඩාකාර මුහුණ ප්‍රසන්න තරුණ බවක් සහිතව නෙලා ඇත.
* පළමු පිළිමයේ නෙළුම් පෙති, ලියවැල් සහිත ඉතා අලංකාර ප්‍රභා මණ්ඩලයක් ඇති අතර, දෙවන පිළිමයේ ඉතා සියුම්ව කැටයම් කල ලියවැල් සහිත ප්‍රභා මණ්ඩලයකි. සාරානාත් පිළිමයේ දෙපස දේවතා රූ දෙකක් හා පිළිමය පසුබිමේ අලංකාර කැටයමක් ද සහිතය.
* සාරානාත් පිළිමයේ වැඩ හිඳින ආසනයේ ඉදිරිපස මැද ධර්ම චක්‍රයකි. මිගදාය සංකේතවත් කිරීමට මුවන් දෙදෙනෙකුද දක්වා ඇත.

04. (i) * ඡද්දන්ත ජාතකය, පද්මපානී බෝසත් රුව, බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුර වැඩම කිරීම.
(ii) * අජන්තා චිත්‍ර ටෙම්පෙරා ක්‍රමයට ඇඳ ඇති බව.
* මැටි, සත්වලෝම, මැලියම්, ගොම අඹරා මිශ්‍රකර සාදාගත් බදාමයක්, ගල් බිත්තිය මත හා චිත්‍ර තලය සලසා ඒ මත හුණු දියර ආලේපකර එම බදාමය වියලුණු පසු චිත්‍ර ඇඳ ඇති බව.
* වර්ණ ස්වභාවික අමුද්‍රව්‍ය වලින් තනාගෙන ඇති බව.
* රතු, කහ, නිල්, කොළ, කළු, සුදු යන වර්ණ හා එම වර්ණවල ප්‍රභේද යොදාගෙන ඇති බව.
* කටු සටහන ගුරු පාටින් ඇඳ වර්ණ ආලේපකර පසුව කළුපාටින් සියුම් රේඛා දක්වා ඇතිබව.
* අඳුරු වර්ණ තුළ දීප්තිමත් වර්ණ ඉස්මතු වන ලෙස යොදා තිබීම.
* ත්‍රිමාණ ලක්‍ෂණ ඉස්මතු වන ලෙස වර්ණකර ඇති බව.

(iii) * මානව රූප මනා ලාලිත්‍යයකින් යුක්තව ඇඳ ඇති බව.
* අවස්ථාවෝචිත ලෙස හැඟීම් ප්‍රකාශනය කර තිබීම. පද්මපාණී, බෝසත්රුව, මරණාසන්න කුමරිය වැනි සිතුවම් මගින් පැහැදිලි කර තිබීම වැදගත්ය.
* චලනය, පරිමාව හා ස්වභාවික ගති ලක්ෂණ ඉස්මතුවන පරිදි සත්වරූප ඇඳ තිබීම.
* පසුබිමෙහි අලංකාර ගස්, ඇතුන් ආදිය ඇඳ තිබේ. * ප්‍රධාන චරිතය විශාලව ඇඳ ඇත.
* පූර්ණ ප්‍රාණවත් රේඛාකරණය.
* එනම් රූප රාමුවක් තුළ සිද්ධියේ අවස්ථා ගණනාවක් කැටිකොට දැක්වීම, ඡද්දන්ත ජාතකය, සිංහලාවධානය වැනි චිත්‍ර මගින් පැහැදිලි කර තිබීම.

05. (i) *පාරාවෝ රජවරුන්ගේ දෛනික ජීවිතය, පාරාවරු වෙනුවෙන් සේවය කළ පිරිස්, පාරාවරුන්ගේ දඩයම් දර්ශණ, යුධ ජයග්‍රහණ, කෙත්වතු. මිදිවතු ආදිය වස්තුවිෂය වී ඇති බව.

(ii) * මෙය ක්‍රි.පූ. 2470ට පමණ ආයත් යුගල මූර්තියක් බව.* දෙදෙනාම සිටගෙන වම්පස ඉදිරියට තබා ඇති බව.
* පිරිමි රුව කයට කෙටි වස්ත්‍රයක් ඇඳ උඩුකයට ඇඳුම් රහිතව සිටින බව, ආභරණ පැළඳ නොමැත.
* සාම්ප්‍රදායික හිස් වැස්මක් පැළඳ සිටී. අත්පහළට හෙලා මිට මොලවාගෙන සිටින බව.
* රජුට ආසන්නව බිසවද සිටින අතර ඇය ගෙල සිට දෙපා දක්වා දිග ඇඳුමක් ඇඳ සිටී. ඇගේ ශරීරාංග ඇඳුමින් විනිවිද පෙනෙන සේ නිර්මාණය කර තිබේ.
* ඇය රජුගේ බඳ වටා අතක් යවා ඔහු තම සිරුරට සමීප කරගෙන සිටී.
* පුරුෂ රූපයේ ශක්ති සම්පන්න බවත් කාන්තා රූපයේ සියුමැලි ගති ලක්ෂණත් ඉස්මතු කර තිබේ.

(iii) * ස්ක්‍රයිබ් මූර්තිය හුණුගලින් නෙලා ඇති මූර්තියකි. * මෙය පැරණි රාජධානි යුගයට අයත් බව.
* මෙහි පැපිරස් ෂත්‍රයක් මත ලියන ආකාරයක් දක්වයි.
* ඔහු වාඩි වී කෙනෙක් කියන දෑ අසා සිටිමින් සටහන් කරන ආකාරය මෙහි දක්වේ.
* මෙහි ස්වභාවික මිනිස් රූපයක ලක්ෂණ හොඳින් දක්වා තිබේ.
* උදරයෙහි මස්පිඩුවල ස්වභාවය, මුහුණෙහි හකු යටට තරමක් ගිලී ඇති ආකාරය වැනි ලක්ෂණ ස්වභාවික යථාර්ථවාදීව දක්වා තිබේ. * නෙෆර්ටිටි මූර්තිය ක්‍රි.පූ. 1345 දී පමණ නිර්මාය කර ඇත.
* මෙය අඟල් 19 ක් උ උඩුකය මූර්තියකි. * හුණුගලින් මෙය තනා තිබේ.
* මෙයින් පරමාදර්ශී ස්ත්‍රී රූපයක ලක්ෂණ දක්වා ඇත.
* ඍජු නාසය, කට හා උඩුකයෙහි අවස්ථා පිළිබඳ මනා අවබෝධයකින් එම අංග යථාර්ථවාදීව දක්වා තිබේ.

06. (i) * පැහැදිලිව හඳුනාගතහැකි වේගවත් පින්සල් පහරවල් දැකිය හැකි වීම.
* වස්තු ආලෝකයට දක්වන ප්‍රතික්‍රියා අධ්‍යයනය කිරීම.
* එකම තේමාව පුන පුනා ඇඳීම. * වර්ණ පිළිබඳ විවිධ අත්හදාබැලීම් කිරීම.
* සම්මත ශාස්ත්‍රාලීය පර්යාලෝකය බැහැර කිරීම. (ල. 5)

(ii) * උපස්ථිතිවාදය 19 වන සියවස්දී පැරීසිය මුල්කරගත් නිදහස් කලා කරුවන්ගේ උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ බව. * මොවුන් සැලෝනයේ ශාස්ත්‍රාලයීය කලාවට පක්ෂපාතී නොවී නව කලා ආරක් ගොඩකගා ගත් බව.* හිරු උදාව උපස්ථිතිවාදී කලාවේ පුරෝගාමී චිත්‍රයක් වූ බව
* නිල් පාට මිශ්‍ර මීදුමින් පිරුණු පරිසරයක හිරු රතු පාටින් පායා එන අයුරු දක්වා තිබේ.
* චිත්‍රයේ පසුබිමෙහි බෝට්ටු කීපයක් ඇඳ ඇත.* උෂ්ණ හා ශීත වර්ණ කලාත්මකව භාවිත කර ඇති බව.
* හිරුගේ ප්‍රතිබිම්බය ජලයේ පතිතව ඇති චමත්කාරය.
* වේගවත් පින්සල් පහරවල් උපයෝගී කරගෙන චිත්‍රය වර්ණවත් කර තිබීම.

(iii) * චිත්‍ර මෙන්ම මූර්ති ශිල්පටයද දක්ෂ සිත්තරෙක් බව.
* උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පියෙකි.
* මොහුගේ චිත්‍රවල චලනය සහිත අවස්ථා සාර්ථකව දක්වා ඇත.
* නැටුම් පන්තිය, නාන බේසම, හිස පීරන ස්ත්‍රිය, ඔහුගේ සිතුවම් කීපයකි.
* වැඩියෙන්ම තේමා කරගත් වස්තු විෂයක් නම් බැලේ නාටිකාංගනාවන්ය.
* තම ගුරුවරයා වටා සිටින බැලේ නාටිකාංගනාවන් සමූහයක් දක්වේ.
* එක් රූපයකට මූලිකත්වයක් දක්වා නැත.
* පර්යාවලෝකනය මගින් පන්ති කාමරයේ ගැඹුර දක්වා ඇත.
* 'නාන බේසම' නම් සිතුවමෙන් බේසමක් තුළ හිඳගෙන සිටින නිරුවත් කාන්තා රූපයක් දක්වේ.
* ඇගේ මුහුණ පැහැදිලිව දක්වා නැත.
* නාරි ලාලිත්‍ය ඉතා උසස් අයුරින් දක්වා තිබේ.
* උණුසුම් වර්ණ මගින් ශරීරයේ වර්ණ ඉදිරිපත් කර ඇත.
* හිස පීරන ස්ත්‍රිය චිත්‍රයේ දක්වන්නේ නිරුවත්ව වාඩි වී හිස පීරණ කාන්තාවකි.
* මෙය පැස්ටල් මාධ්‍යයෙන් ඇඳ තිබේ. ඇගේ වාඩි වී සිටින ඉරියව්ව ඉතා නිවැරදිව ඇඳ ඇත.
* ඔහුගේ වේගවත් හා නිදහස් චිත්‍ර ශෛලීය ලක්ෂණ මේ සිතුවම් වලින් ඉස්මතු වේ.

**තෙවන වාර පරීක්ෂණය - 2018 - 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව II - ආදර්ශ චිත්‍රය - පිළිතුරු පත්‍රය**



**ශාලාධිපති සඳහා උපදෙස්**

- අරලිය මල් සහිත අත්තක්
- කුඩා මැටි කලයක්
- ඇපල් ගෙඩියක්
- පීරිසයක්
- අඩක් කහ පැහැති ජලයෙන් පුරවන ලද වීදුරුවක්
- බීම බටයක්
- හතරැස් බිස්කට් පෙට්ටියක් (සුදු කඩදාසියෙන් ආවරණය කර) වර්ණවත් රෙදි කැබැල්ලක්
- ද්‍රව්‍ය තැබීමට ආධාරකයක් (ඩ්‍රෝවින් බෝඩ්)

**තෙවන වාර පරීක්ෂණය - 2018 - 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක**

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

අභිමතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයන් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇද වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකත් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරීමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාන්තලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය)(ල.20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

**දෙවන වාර පරීක්ෂණය 2018 - 13 ශ්‍රේණිය - චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක**

**"අ" කොටස - චිත්‍ර සංරචනය**

ලකුණු දීමේ පටිපාටිය:-

**III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය**

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව (ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය(ල.20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය**

1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් (ලකුණු 20)
2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20) (ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය**

1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව (ලකුණු 20)
2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව (ලකුණු 20)
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය(ලකුණු 20) (ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)